සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

07 ශ්‍රේණිය — වර්ෂ අවසාන පරීක්ෂණය - 2019

# පුරවැසි අධ්‍යාපනය I

කාලය පැය 1 1/2

නම / විභාග අංකය : ..............................................................................................................

**01 වන ප්‍රශ්නයේ සිට 10 වන ප්‍රශ්නය දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01). වර්තමානයේ පුද්ගලයෙකු නිවැරදිව හඳුනා ගැනීම සඳහා භාවිතා කරනු ලබන පරීක්ෂණය හඳුන්වනු ලබන්නේ කුමන නමකින්ද?
(i) DNA පරීක්ෂණය (ii) HIV පරීක්ෂණය (iii) FBC පරීක්ෂණය (iv) MRI පරීක්ෂණය

(02). ඇසුරුම් සහිත භාණ්ඩයක් මිලදී ගන්නා විට අප සොයා බැලිය යුතු ප්‍රධාන කරුණු තුනක් අඩංගු ප්‍රකාශය තෝරන්න.
(i) නිෂ්පාදිත දිනය, ශුද්ධ බර, කල්තබා ගැනීමේ ක්‍රමය
(ii) කල් ඉකුත් වන දිනය, අඩංගු ද්‍රව්‍ය, භාණ්ඩයේ වටිනාකම
(iii) නිෂ්පාදිත දිනය, ශුද්ධ බර, කල්ඉකුත් වන දිනය
(iv) ශුද්ධ බර, උපරිම සිල්ලර මිළ, කල් තබා ගැනීමේ ක්‍රමය

(03). ඔබේ පියාගේ අක්කාගේ නංගිගේ දුවට ඔබ කියන නෑකම කුමක්ද?
(i) නැන්දා (ii) ලොකු අම්මා (iii) නැන්දම්මා ( iv ) නෑනා

(04). ඔබේ අම්මාගේ මල්ලීගේ බිරිඳට ඔබ කියන නෑකම කුමක්ද?
(i) නෑනා (ii) නැන්දා (iii) ලොකු අම්මා (iv) පුංචි අම්මා

(05). රාජ්‍ය සේවකයෙකු විශ්‍රාම යාමට මාස කීයකට ප්‍රථමයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතුද?
( i ) මාස 03කට ( ii ) මාස 06කට ( iii) මාස 09කට ( iv ) මාස 12කට

(06). ඕනෑම අභියෝගයක් ජය ගැනීම සඳහා පුද්ගලයෙකු සතුව තිබිය යුතු ගුණාංගය වන්නේ,
( i ) අනුකම්පාව හා දැඩි කැපවීම ( ii ) සහකම්පනය හා අනුකම්පාව
( iii) දැඩි ආත්මවිශ්වාසය හා දැඩි කැපවීම ( iv ) දැඩි ආත්ම විශ්වාසය හා දැඩි අනුකම්පාව

(07). ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය නිර්මාණය කිරීමේ කමිටුවේ සභාපති ධූරය දැරුවේ කවුද?
( i ) ජී.ජී. පොන්නම්බලම් මැතිතුමා ( ii ) ආචාර්ය සෙනරත් පරණවිතාන මැතිතුමා
( iii) සර් ජෝන් කොතලාවල මැතිතුමා ( iv ) එස්.ඩබ්ලිව්. ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා

(08). ඉන්දියාවේ ජාතික පුෂ්පය කුමක්ද?
(i) නෙළුම් මල ( ii ) මානෙල් මල (iii) නා මල ( iv ) ඕලු මල

(09). පවුලේ සාමාජිකයෙකු ලෙස ජීවත් වීමේදී ඔබට ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,
(i) පාරම්පරික දැනුම ලැබීම ( ii ) ආරක්ෂාව ලැබීම
( iii) සෙනෙහස හා ආදරය ලැබීම ( iv ) සංස්කෘතිය පවරා ගැනීමට නොහැකි වීම

(10). පරිසර සංරක්ෂණය සඳහා සහයෝගය ලබාගත නොහැකි සංවිධානයකි.
( i ) මධ්‍යම පරිසර අධිකාරිය ( ii ) හදබිම අධිකාරිය
( iii) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ( iv ) එක්සත් ජාතීන්ගේ පරිසර සංවිධානය

**පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණද වැරදි නම් ( x ) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

(11). මව, පියා, දරුවන් ඇතුළු පිය පාර්ශවයේ හා මව් පාර්ශවයේ ඥාතීන් කිහිපදෙනෙකු එකට ජීවත් වන පවුල් ඒකකය විස්තෘත පවුල ලෙස හැඳින්වේ ( )

(12). යහපත් දේ පිළිගැනීම හා අයහපත් දේ ප්‍රතික්ෂේප කිරීම යහපත් ගුණාංගයකි ( )

(13). මිතුරන් ඇසුරු කිරීමට අපි සහජයෙන්ම කැමති නැත ( )

(14). මිනිසාගේ සිතට එන චිත්තවේගයන් පාලනය කරගත නොහැකිය ( )

(15). ශ්‍රී ලංකාවේ පළතුරු සහ එළවළු ප්‍රවාහනයේ දී විශාල ප්‍රමාණයක් විනාශ වීමට ලක්වී අපතේ යැමක් දක්නට ලැබේ. ( )

**16 සිට 20 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(16). ජන සමාජයක පවතින සම්ප්‍රදායන් යනු කුමක්ද? ..........................................................................

..............................................................................................................................................

(17). වෘත්තිය සමිතියක් පිහිටු වීමේ ප්‍රධාන අරමුණ කවරේද? ..............................................................

..............................................................................................................................................

(18). අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පාසල් ළමුන් සඳහා ලබා දෙන සුභ සාධන කටයුත්තක් නම් කරන්න.

..............................................................................................................................................

(19) දැනුම, ඇදහිලි, කලා, නීති, සිරිත් විරිත්, ඇගයීම් හා මිනිසා විසින් සමාජයේ ජීවත් වන පුද්ගලයෙකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු ඇබ්බැහිකම් හා හැකියාවන්ගේ සමස්තය සංස්කෘතියයි. මෙසේ ප්‍රකාශ කළේ කවුද? ..............................................................................................................................

..............................................................................................................................................

(20) සංස්කෘතියක් තවත් සංස්කෘතියකින් වෙනස් වේ. එසේ වෙනස් වීම සංස්කෘතික විවිධත්වය වේ. සංස්කෘතික විවිධත්වයට බලපාන එක් හේතුවක් නම් කරන්න. ..........................................................

..............................................................................................................................................

## II කොටස

**ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක ලකුණු 12 බැගින් හිමි වේ.**

(01) i. පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ 3ක් ලියන්න. (ලකුණු 03)
ii. පවුලේ සාමාජිකයෙකු ලෙස ජීවත්වන විට ඇතිවන ප්‍රයෝජන මොනවාද? (ලකුණු 04)
iii. ඔබේ ජීවිතය සාර්ථක කරගැනීම සඳහා උපකාරවන හිතකර බලවේග නම් කර ඒවා ජීවිතයේ සාර්ථකත්වයට දායක කරගත හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

(02) i. ක්‍රීඩාවල යෙදීමෙන් පුද්ගලයෙකු තුළ වර්ධනය වන ගුණාංග මොනවාද? (ලකුණු 03)
ii. පුද්ගලයෙකු තුළ ජනිත වන අයහපත් චිත්තවේගී තත්වයන් පාලනය කරගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාකාරකම් 04ක් ලියන්න. (ලකුණු 04)
iii. අපගේ අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා ප්‍රයෝජනවත් වන සේවාවන් 5ක් නම් කර එය අපගේ අවශ්‍යතාවයට දායක කරගත හැකි ආකාරය විස්තර කරන්න (ලකුණු 05)

(03) i. යහපත් පුරවැසියෙකු සතු ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 03)
ii. ජන සමාජයක ජීවත්වන පුරවැසියෙකුට ලැබෙන අයිතිවාසිකම්වල ඇති විශේෂ ලක්ෂණ 04ක් ලියන්න. (ලකුණු 04)
iii. රටක ජීවත්වන පුරවැසියෙකුට ලැබෙන දේශපාලන අයිතිවාසිකම් 05ක් නම් කරන්න. (ලකුණු 05)

(04) i. සංස්කෘතියක ඇති අංග 3 ක් නම් කරන්න. (ලකුණු 03)
ii. බහු සංස්කෘතික ජන සමාජයක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ 4 ක් නම් කරන්න (ලකුණු 04)
iii. සංස්කෘතිය පවරා දීම පවුලේ ප්‍රධාන කාර්යභාරයකි. ඔබට පවුලෙන් ලැබුණු සංස්කෘතික දායාදයන් මොනවාද? (ලකුණු 05)

(05) i. අප රටේ ජාතික කොඩියේ සංකේත මගින් නිරූපණය වන දේ පහත සඳහන් කොටුවේ ඉදිරියෙන් ලියා දක්වන්න. (ලකුණු 03)

| | සංකේතය | නිරූපණය වන දෑ |
|---|---|---|
| 01 | කහපාට සිංහයා | |
| 02 | රතු පසුබිමේ සිව්කොන බෝපත් හතර | |
| 03 | කොඩියේ වම්පස කොළ සහ තැඹිලි පැහැති තීරු | |

ii. අප රටේ ජාතික ගීය ගායනා කරනු ලබන්නේ වැදගත් අවස්ථාවලදීය. එනම්, ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථා 4ක් නම් කරන්න. (ලකුණු 04)
iii. සාර ධර්ම යනු කුමක්දැයි පැහැදිලි කර සමාජයේ යහපැවැත්ම සඳහා සාරධර්මවල අවශ්‍යතාවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

තෙවන වාර පරීක්ෂණය - 2019

# පුරවැසි අධ්‍යාපනය

07 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

## I කොටස

(01). -1
(02). -3
(03). -4
(04). -2
(05). -2
(06).-3
(07).-4
(08).-1
(09).-4
(10).-2
(11).- ✓
(12).-✓
(13).-X
(14).-X
(15).-✓
(16). දීර්ඝ කාලයක් තිස්සේ පැවැත එන සිරිත් විරිත් හා චාරිත්‍ර වාරිත්‍ර සමුදායක් වේ.
(17). වෘත්තිය අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම.
(18). නොමිලේ පොත්, අධ්‍යාපනය, පෝෂණය, සුහග ශිෂ්‍යත්වය, විදේශ ශිෂ්‍යත්ව
(19). ඊ.බී. ටයිලර්
(20). ජනවර්ගය, ආගම, භාෂාව, ජීවනෝපාය මාර්ග වේ.

## II කොටස

(01) i
❖ ඥාතීත්වය මත ගොඩ නැගීම.
❖ විස්තෘත හා න්‍යෂ්ටික පවුල් ලක්ෂණ තිබීම.
❖ එක් වාසස්ථානයක ජීවත්වීම.
❖ සාමාජිකයන් එක් වාසස්ථානයක ජීවත්වීම.
❖ ආදරය, දයාව, කරුණාව, සෙනෙහස වැනි ගුණාංග මත සාමාජිකයන් එකට බැඳී තිබීම .(ලකුණු 1 x 3 = 3)

ii
❖ ආරක්ෂාව ලැබීම.
❖ යහපත් පූර්වාදර්ශ ලැබීම.
❖ නායකත්ව ගුණාංග වර්ධනය වීම .
❖ නිවැරදි හැසිරීම් රටාවට හුරු වීම.
❖ පාරම්පරික දැනුම ලැබීම.
❖ අන්‍ය අදහස් ගරු කිරීම. (ලකුණු 04)

iii ඔබේ ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා උපකාරි වන හිතකර බලවේග ලෙස පහත සඳහන් දෑ යොදාගත හැකිය. ඒවා ජීවිතයට යොදාගන්නා ආකාරය නිදසුන් ලෙස රැගෙන විස්තර කිරීමට ලකුණු 05 ක් ලබා දෙන්න.
❖ පවුල ❖ ආගමික ස්ථාන ❖ හොඳ පොත්පත්
❖ පාසල ❖ කල්‍යාණ මිත්‍රයන් ❖ හොඳ මාධ්‍ය වැඩ සටහන් (1 x 5 = 5)

2) i
❖ ජය පරාජය සතුටින් විඳ දරා ගැනීම
❖ සාධාරණත්වය අගය කිරීම
❖ විනෝදය හා සතුට ලැබීම
❖ නීති ගරුක වීම
❖ විධාන පිළිපැදීම
(1 x 3 = 3 , ලකුණු 1 බැගින් )

ii
❖ ආගමික කටයුතු වල යෙදීම
❖ ඇවිදීම
❖ පොත් පත් කියවීම
❖ චිත්‍ර ඇඳීම
❖ පුවත්පත් කියවීම
❖ ගුවන් විදුලියට සවන් දීම
❖ ක්‍රීඩාවල නිරත වීම
( ලකුණු 1 x 4 )

iii අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය, විදුලි බලය, සන්නිවේදනය, ආරක්ෂක සේවය, කර්මාන්ත ඉදි කිරීම, වෛද්‍ය සේවය, ආදී සේවාවන් වලින් ලැබෙන ප්‍රයෝජනය හා එය මිනිසා යොදා ගන්නා ආකාරය

විස්තර කර ඇත්නම් ( ලකුණු 05 )

(03) i යහපත් පුරවැසියෙකු සතුවිය යුතු ගුණාංග පහත දැක්වේ.
❖ නායකත්වය දැරීම ❖ ඉවසීම ❖ පොදු දේපල ආරක්ෂා කිරීම
❖ අවංක බව ❖ පරාර්ථකාමී බව ❖ නිහතමානී බව (ලකුණු 1 x 3 = 3 )

ii ආත්මාර්ථකාමිත්වයෙන් තොරවීම
❖ යුතුකම් සමඟ බැඳී තිබීම
❖ සමාජය තුළින්ම හිමි වීම
❖ සමාජයේ පොදු යහපත සමඟ එකට බැඳී තිබීම
❖ අසීමිත නොවී තිබීම (ලකුණු 1 x 4 = 4 )

03) iii රටක ජීවත් වන පුරවැසියෙකුට ලැබෙන දේශපාලන අයිතිවාසිකම් පහත සඳහන් ඒවාය. ඉන් 05 කට ලකුණු ලබා දෙන්න.

- ❖ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය
- ❖ ඡන්දය ලබා ගැනීමේ අයිතිය
- ❖ දේශපාලන පක්ෂයකට බැඳීමේ අයිතිය
- ❖ කැමැති ආණ්ඩුවක් පත් කර ගැනීමේ අයිතිය
- ❖ ආණ්ඩුව විවේචනය කිරීමේ අයිතිය
- ❖ රජයේ තනතුරු දැරීමේ අයිතිය

04) i
- ❖ ආගම, දැනුම, අධ්‍යාපනය, සිරිත් විරිත්
- ❖ නීතිරීති හා සම්ප්‍රදායන්
- ❖ කලාශිල්ප
- ❖ ආහාර පාන
- ❖ සාහිත්‍ය
- ❖ විශ්වාසය/ භාෂාව

(ලකුණු 1 x 3 = 3)

ii
- ❖ ජන වර්ග ගණනාවක් ජීවත් වීම
- ❖ ආගම් වර්ග ගණනාවක් එම සමාජයේ තිබීම.
- ❖ භාෂාවන් අනුව ජනයා විවිධ ජනවර්ගවලට බෙදී ජීවත් වීම
- ❖ විවිධ ජීවනෝපායන් හා වෘත්තීන් ගණනාවක් සමාජය තුළ තිබීම.

iii
- ❖ වැඩිහිටියන්ට ගරු කිරීම
- ❖ තම ආගම ඇදහීම හා ආගමික නායකයන්ට ගෞරව දැක්වීම
- ❖ සිංහල හා හින්දු අලුත් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර ඉටු කිරීම
- ❖ අධ්‍යාපනය ලැබීම
- ❖ ඇඳුම් පැළඳුම් ඇඳීම
- ❖ පරම්පරාවෙන් පැවැත එන විවිධ උත්සවයක් පවත්වාගෙන යෑම

(ලකුණු 1 x 5 = 5 )

05) i 1 සිංහල ජාතිය, සිංහල ජනතාවගේ විනය ගරුක බව, නිර්භීතකම, අභිමානය හා නායකත්වය සාධාරණත්වය (ලකුණු 1 x 3 = 3)

2 මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණ හා සියළු ආගම්වල ගරු කිරීමේ උතුම් ගුණය

3 තැඹිලි පාට - දෙමළ ජන වර්ගයත්
කොළ පාට - මුස්ලිම් ජනවර්ගයත් නියෝජනය කරයි.

ii
- ❖ ජාතික උත්සව අවස්ථාවකදී
- ❖ රාජ්‍ය නායකයන් සහභාගිවන උත්සවයකදී
- ❖ රාජ්‍ය උත්සවයකදී
- ❖ පාසල් හා වෙනත් පොදු වැදගත්කමක් ඇති උත්සව වලදී
- ❖ ශ්‍රී ලංකාව නියෝජනය කරන ජාත්‍යාන්තර තරගවලදී
- ❖ වෙනත් වැදගත් උත්සව අවස්ථාවලදීය (ලකුණු 1 x 4 = 4)

iii සමාජය හා පුද්ගල ජීවිතය සාරවත් කරන මානුෂීය ගුණාංග සාරධර්ම වේ. එවැනි සමාජය ජීවත්වන පුද්ගලයා විනය ගරුක විය යුතුය. අවංකව, ඉවසීමෙන් නිහතමානි , ත්‍යාගශීලිව , මිත්‍රශීලිව සමාජය සමග කටයුතු කළ යුතුයි. කාරුණිකව අසල්වැසියන්ට, මිතුරන් හා සියලුම සත්වයන්ට වෛර ක්‍රෝධ නොකර දයාව , සෙනෙහස , ආදරය පවත්වාගෙන යාමත්, ආගමික ස්ථානවලදී සාරධර්ම ආරක්ෂා කිරීමත් විස්තර කරන්න

(ලකුණු 1 x 5 = 5 )